# 09 ශ්‍රේණිය

# දෙවන වාර පරීක්ෂණය - 2016 ජූලි

**ගණිතය** | කාලය පැය 2යි.

නම/විභාග අංකය :

## I - කොටස

- **සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් හිමිවේ)**

(01) 1 - 100 ක් අතර ලිවිය හැකි ඉරට්ට ප්‍රථමක සංඛ්‍යාව හෝ සංඛ්‍යා ලියන්න.

(02) රූපයේ දැක්වෙන කරත්ත රෝදයේ වටේ දාරය ඔස්සේ තහඩුවක් ගැසීමට අවශ්‍යය. තහඩුවේ අවම දිග සොයන්න.




(03) $x^2 \times x^3 \times x^5$ කෙටිකර දක්වන්න.

(04) රූපයේ දැක්වෙන $x$ හි අගය සොයන්න.




(05) දී ඇති වෘන්ත පත්‍ර සටහනේ දැක්වෙන සංඛ්‍යා ව්‍යාප්තියේ මාතය කුමක්ද?

| වෘන්ත | පත්‍ර |
|---|---|
| 1 | 0, 1 |
| 2 | 1, 1, 2, 2, 2 |
| 3 | 2, 2, 3 |

(06) දී ඇති වෙන් රූපයේ දැක්වෙන තොරතුරු අනුව A කුලකයට අයත් නොවන අවයව ලියා දක්වන්න.




(07) a = -2 වන විට 3a - 2 ප්‍රකාශනයේ අගය සොයන්න.

(08) රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ ඉංග්‍රීසි අක්ෂරයෙන් දක්වා ඇති කෝණයේ අගය සොයන්න.




(09) සීනි 1kg ක මිල රු. 104ක් වන විට 750g ක මිල කොපමණද?

(10) චිත්තයක් සඳහා අවශ්‍ය රෙදි ප්‍රමාණය මීටර් එකයි කාලකි. 5m ක චිත්ත රෙද්දකින් ලබාගත හැකි චිත්ත සංඛ්‍යාව කොපමණද?

(11) $ax = c + by$ සූත්‍රයේ y උක්ත කරන්න.

(12) දී ඇති ත්‍රිකෝණයේ m මගින් දැක්වෙන පාදයේ දිග සෙවීම සඳහා පහත හිස්තැන් සඳහා යෙදිය යුතු අගයන් යොදන්න.

$m^2 + \text{...............} = 25^2$

$m = \text{...........}$




(13) නිමල් 2014 වර්ෂයේ පළමු වාරයේ ගණිතය ඇගයීම් හතර සඳහා පිළිවෙළින් 18, 13, 15, 20 ලෙස ලකුණු ලබාගෙන තිබුණි. ඔහුගේ ගණිතය ඇගයීමක මධ්‍යනය ලකුණ සොයන්න.

(14) $\log_2 32$ හි අගය සොයන්න.

To download past papers visit www.vajirapani.blogspot.com

(15) 101200000 යනු ඉලක්කම් තුනකින් සකස් කළ සංඛ්‍යාවකි. මෙහි විද්‍යාත්මක අංකනය ලියා දක්වන්න.

(16) සමීකරණය විසඳා $x$ හි අගය සොයන්න $3x - 8 = x + 2$

(17) රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හා y හි අගයයන් වෙන වෙනම සොයන්න.




(18) රූපයේ දැක්වෙන සිලින්ඩරයේ ධාරිතාවය ලීටර් එකකි. දැනට ජලය පිරී ඇති උස 5cm කි. එහි ඇති ජල පරිමාව $cm^3$ වලින් සොයන්න.




(19) A හා B යනු එකිනෙකට 90 m දුරින් පිහිටි විදුලි කණු දෙකකි. නිවසකට විදුලිය ලබා ගැනීම සඳහා මෙම කණු දෙකට ම සමදුරින් C නම් වෙනත් කණුවක් සිටුවිය යුතුය. තව ද මෙම C කණුව A කණුවේ සිට 60m දුරින් ද තිබිය යුතුය. පථ පිළිබඳ ඔබේ දැනුම භාවිතයෙන් දළ රූප සටහනක A, B හා C කණුවල පිහිටීම ඇඳ දක්වන්න.

(20) i. 1 x 3, 2 x 4, 3 x 5, ...................

ii. $\frac{1 \times 2}{2}, \frac{2 \times 3}{2}, \frac{3 \times 4}{2}$, ................

මෙම සංඛ්‍යා රටා දෙක සැලකීමෙන් පහත ඒවායින් ඒවාට ගැළපෙන පොදු පද යුගලය තෝරා ලියන්න.

a. $n(2n+1)$, $\frac{n^2(n+1)}{2}$

b. $n(n+1)$, $\frac{n(n+1)}{2}$

c. $n(n+2)$, $\frac{n(n+1)}{2}$

## II - කොටස

- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
  **(පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 11 බැගින් ද හිමි වේ.)**

(01) ගණිතය විෂයයේ රසවත් ම හා ගැඹුරින් ම අධ්‍යයනය කළ යුතු ඉතා වැදගත් කොටසක් ලෙස ජ්‍යාමිතිය හැඳින්වේ. එහි ප්‍රධානතම අංගයක් වන නිර්මාණකරණය පන්ති කාමරයේ දී ඔබ හොඳින් සිදු කළ අයුරු සිහිපත් කර ගන්න.

- මිලි මීටර හා සෙන්ටිමීටර පරිමාණය සහිත සරල දාරයක්, කවකටුව හා සිහින්ව තුඩ සකසාගත් පැන්සලයක් පමණක් භාවිතා කරමින්,

i. 8cm ක් දිග AB සරල රේඛා ඛණ්ඩයක් ඇඳ නම් කරන්න. (ල.-2)

ii. එම AB රේඛා ඛණ්ඩයේ ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න. (ල.-2)

iii. එම ලම්බ සමච්ඡේදකය හා AB රේඛාව හමුවන ලක්ෂ්‍යය O යැයි නම් කරන්න. (ල.-1)

iv. O කේන්ද්‍රය ලෙස ද OA අරය ලෙස ද ගෙන වෘත්තයක් නිර්මාණය කරන්න. (ල.-2)

v. වෘත්තය හා ලම්බ සමච්ඡේදකය හමුවන ස්ථාන (ඡේදනය) C හා D ලෙස නම් කරන්න. (ල.-2)

vi. AC හා BC යා කරන්න. (ල.-2)

vii. $A\hat{C}B$ යේ අගය මැන ලියන්න. (ල.-1)

To download past papers visit
www.vajirapani.blogspot.com

viii. ABC ත්‍රිකෝණය ආකාර දෙකකින් නම් කරන්න. (ල.-2)

ix. ABC ත්‍රිකෝණයේ පාදයන් හි දිග අතර සම්බන්ධතාවයක් ලියා දක්වන්න. (ල.-2)

(02) i. 0.25 ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ල.-2)

ii. $\frac{2}{3} + \frac{1}{6}$ සුළු කරන්න. (ල.-2)

iii. $\frac{1}{0.4} + \frac{1}{0.2}$ සුළු කරන්න. (ල.-2)

iv. නිමල් 500m පයින් ගමන් කර පාසල් පැමිණිය යුතුය. නමුත් සුනිල් එමෙන් $\frac{3}{5}$ ක් වැනි කෙටි දුරක් ගමන් කර පාසල වෙත පැමිණේ.

a. සුනිල් ගමන් කරන දුර කොතෙක් ද? (ල.-2)

b. සුනිල්ට වඩා නිමල් ගමන් කරන දුර, නිමල් ගමන් කරන මුළු දුරෙහි භාගයක් ලෙස දක්වා එය ප්‍රතිශතයක් බවට හරවන්න. (ල.-3)

(03) රූපයේ දැක්වෙන්නේ අනුර මහතා මිලදී ගත් හරි හතරැස් ඉඩමක දළ සටහනකි.




i. අනුර මහතාගේ ඉඩම වටා වැටක් ගැසීමට අවශ්‍ය වන කම්බිවල එක පොටක දිග කීයද? (ල.-2)

ii. ඔහු පසුකලෙක මෙම ඉඩමේ ප්‍රමාණය පිළිබඳ පසුතැවි ම හේතුවෙන් තවත් මීටර් $x$ ප්‍රමාණයකින් දිග වැඩි කර ගන්නටත් මීටර් y ප්‍රමාණයකින් පළල වැඩි කිරීමටත් අදහස් කළේය. දැන් ඔහුගේ ඉඩමේ දළ සටහනක් ඔබේ උත්තර පත්‍රයේ ඇඳ මිනුම් $x$ හා y ඇසුරින් ලකුණු කරන්න. (ල.-3)

iii. $x$ හා y ඇසුරින් අලුත් ඉඩමේ පරිමිතිය ලියන්න. (ල.-2)

iv. ඉඩම විශාල කිරීමෙන් පසු එහි වර්ගඵලය ලබාගැනීම සඳහා දිග හා පළල ද්විපද ප්‍රකාශනවල ගුණිතයක් ලෙස ලියා සුළු කරන්න. (ල.-2)

v. $x = 10$m හා y = 6m නම් ඉඩමේ වර්ගඵලය වර්ග මීටර්වලින් සොයන්න. (ල.-2)

(04) i. යම් කිසි සංඛ්‍යාවක් තවත් සංඛ්‍යාවකින් ඉතිරි නැතිව බෙදිය හැකි නම් එම සංඛ්‍යාව හඳුන්වන නම කුමක්ද? (ල.-1)

ii. පහත දක්වා ඇති වීජීය ප්‍රකාශනවල සාධක සොයන්න.

a) $3x + 6$ (ල.-1)

b) $x(x + 2) - 3(x + 2)$ (ල.-2)

To download past papers visit
www.vajirapani.blogspot.com

c) $ax - by + bx - ay$ (ල.-2)

d) $x^2 + 5x + 6$ (ල.-2)

iii. පහත සමීකරණය විසඳා $x$ හි අගය සොයන්න. (ල.-3)

$$3\left(\frac{x+2}{4}\right) = 15$$

(05)

**සේල් ! සේල් ! සේල් !**
**සෑම භාණ්ඩයක් සඳහාම 10% මිල අඩුකිරීමක්**

ඉහත දැක්වෙන්නේ වෙළඳ සැලක් ඉදිරිපිට යොදා තිබූ දැන්වීමකි. මෙම වෙළඳ සැලට ගිය කුමාර මහතා රුපියල් 5000ක් වටිනා ජංගම දුරකථනයක් මිලදී ගත්තේය.

i. දුරකථනය සඳහා අඩුකරන ලද මුදල සොයන්න. (ල.-2)

ii. ඔහු දුරකථනය ලබාගත් මුදල කීයද? (ල.-2)

iii. කුමාර මහතා මෙම මුදල ගෙවීම සඳහා භාවිතා කළේ ඇමරිකානු ඩොලර් 100ක නෝට්ටුවකි. ඔහුට ලැබෙන ඉතිරි මුදල රුපියල්වලින් සොයන්න.
(ඇ.ඩො. 1 = රු. 130ක් ලෙස ගන්න) (ල.-3)

iv. ඉතිරි මුදල වාර්ෂික පොළී අනුපාතිකය 14% වන බැංකුවක තැන්පත් කළේ නම් ඔහුට මාසිකව ලැබෙන පොළී මුදල සොයන්න. (ල.-2)

v. මාසික පොළිය ලබා නොගෙන වසර අවසානයේ මුළු මුදලට ලබාගත්තේ නම් ඔහු ලබාගත් මුදල කීයද? (ල.-2)

(06) රූපයේ දැක්වෙන ක්‍රීඩා පිටිය සෘජු කෝණාස්‍ර හැඩයකින් යුක්තවන අතර එහි දිග 90mක් හා පළල 60mක් ද. වේ. නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ මළල ක්‍රීඩා සඳහා භාවිතා කළ හැකි ධාවන පථය ද පිටිය තුළ සකසා ඇත. ධාවය පථයේ ලකුණු කර ඇති ඇතුළත සීමාව පමණක් සලකමින්,




i. අර්ධ වෘත්තාකාර කොටසක අරය කීයද? (ල.-1)

ii. ධාවන පථයේ සම්පූර්ණ දුර මීටර් කීයද? (ල.-3)

iii. 1500m තරඟයක් සඳහා සහභාගී වන ක්‍රීඩකයකු මෙහි වට කීයක් දිවිය යුතුදැයි හේතු සහිතව පෙන්වා දෙන්න. (ල.-3)

iv. ධාවන පථයෙන් පිටත ප්‍රදේශයේ තණකොළ වවා අලංකරණය කිරීමට අවශ්‍යව ඇත. එසේ තණකොළ වැවිය යුතු ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග මීටර් 2862.5ක් බව පෙන්වන්න. (ල.-4)